වාරිමාර්ග අමාත්‍යංශය

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය - කොත්මලේ

# වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආධුනිකයින් බඳවා ගැනීම

## 2020(2 වන බඳවා ගැනීම)

කොත්මලේ, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය, තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ජාතික වෘත්තීය කුසලතා 06 වන මට්ටම සඳහා ප්‍රතීතනය කර ඇති පූර්ණ රාජ්‍ය ආයතනයකි. මෙම ආයතනය මඟින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අවිවාහක අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු පාඨමාලා දෑ අවුරුදු නේවාසික පුහුණුවකින් හා එක් අවුරුදු ක්ෂේත්‍ර පුහුණු කාලයකින් සමන්විත වේ.

01. ආධුනිකයින් බඳවා ගැනීම

01. අවම සුදුසුකම:

I. අයදුම්කරු, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 26 ට අඩු යහපත් මානසික හා කායික සෞඛ්‍යයෙන් හෙබි අයෙකු විය යුතුය.

II. අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දමිළ, ඉංග්‍රිසි, ගණිතය හා විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකින් සමත් වී තිබිය යුතුය.

III. අ.පො.ස.(උ.පෙළ) විභාගය ගණිත විෂය ධාරාවෙන් විෂයයන් 03 ක් එක් වරකින් සමත් වී තිබිය යුතුය.

02. ක්‍රමවේදය:-

වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආධුනිකයින් 30 - 40 දෙනෙකු පමණ බඳවා ගැනීමට අපේක්ෂිතය.

ඉහතින් සඳහන් කරන ලද සුදුසුකම් වලට අමතරව බඳවා ගැනීමේ ක්‍රමවේදය පහතින් දක්වා ඇත.

I. සුදුසුකම්ලත් අයදුම්කරුවන් ගණිතය හා බුද්ධි පරීක්ෂණය යන විෂයයන්ට අදාලව ඉංග්‍රිසි මාධ්‍යයෙන් පවත්වනු ලබන තරඟ විභාගයකට පෙනී සිටිය යුතුය. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා පිළිතුරු ලිවීමට කාලය පැය 1 කි.

II. ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී, අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ශාරීරික, මානසික යෝග්‍යතාවය හා අදාල ක්ෂේත්‍රයට ඇති රුචිකත්වය පිළිබඳ ඇගයුමක් කරනු ලැබේ.

III. ලිඛිත විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළින්ම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

**03.** අයදුම්පත් ඉදිරිපත් කිරීම:

I. ආයතනයේ වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයදුම්පත් බාගත කළ හැකිය. (www.kitiiwm.gov.lk)

II. අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යයන ආයතනයේ ආයතනාධිපති වෙත යොමු කළ යුතුය.

III. මෙම බඳවා ගැනීමට අදාල වෙනත් තොරතුරු 081-2356372 යන දුරකථන අංකයට, ආයතනයේ අධ්‍යයන අංශයේ අනුෂා දූනුතිලක මහත්මිය ඇමතීමෙන් ලබා ගත හැකිය.

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020 නොවැම්බර් 20 වන දින වේ.

V. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ආයතනාධිපති, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය රිවර්සයිඩ්, මාවතුර, කොත්මලේ යන ලිපිනයට (9" x 4") ලියුම් කවරයක බහා එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පාඨමාලාවේ නම (වාරිමාර්ග තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව) කරුණාකර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**04.** විශේෂ කොන්දේසි:-

I. පුහුණු පාඨමාලාව පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

II. මෙම පුහුණු පාඨමාලාවල අධ්‍යයන කටයුතු සඳහා යන සියලු වියදම්, ශ්‍රී ලංකා රජය මඟින් දරනු ලබන අතර,නේවාසික පහසුකම් පුහුණු ආයතනය මඟින් සපයනු ඇත. එහෙත් පුහුණු කාලය තුළදී, ආහාරපාන, භෞතික හා අනෙකුත් පෞද්ගලික වියදම් අභ්‍යාසලාභීන් විසින් දැරිය යුතු වේ.

III. තෝරා ගනු ලබන අභ්‍යාසලාභීන්, අභ්‍යාස ආයතනයේ විනය හා ආචාර ධර්ම වලට යටත්ව පුහුණුව අවසන් කරන බවට මෙන්ම පුහුණු කාලසීමාව සාර්ථකව අවසන් කරන බවට බැඳෙන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

IV. පුහුණු කාලය අවසන් කිරීමට මත්තෙන්,පුහුණුවෙන් ඉවත් වන්නේ නම් එතෙක් ඔහු හෝ ඇය වෙනුවෙන් රජය මඟින් දැරූ වියදම ආපසු ගෙවීමට බැඳී සිටින අතර,ඒ සඳහා වූ ඇප ගිවිසුමකට එළඹිය යුතුය.

V. පුහුණු කාලය තුළ පවත්වනු ලබන සමාසික, වාර්ෂික මෙන්ම පුහුණු කාලය අවසානයේදී පවත්වනු ලබන අවසන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලදී සමත්වන ආධුනිකයන් සඳහා NVQ – Level 6 මට්ටමේ ඩිප්ලෝමා සහතිකයක් පුහුණු ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර පුහුණුවට අදාල රැකියා ලබා දීමට, මෙම අමාත්‍යාංශය හෝ පුහුණු ආයතනය බැඳී නොසිටියි.

VI. අයදුම්කරුවන් වෙනත් කිසිදු උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොතිබිය යුතුය.

අනුර දිසානායක,
ලේකම්,
වාරිමාර්ග අමාත්‍යාංශය